තේ තතු
පර්යේෂණ ක්ෂේත්‍රයේ 81 වසරක අභිමානය
81 வருட ஆய்வின் சாதனை
81 Years of Research Achievement
THE TEA RESEARCH INSTITUTE OF SRI LANKA
UNITAS SALUS NOSTRA INCORPORATED 1925
ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රකාශනයකි ISSN - 1391 - 6785
සය වන කාණ්ඩය, පළවන කලාපය 2006 ජනවාරි - ජූනි

# නව පොහොර මිල සමග U - මිශ්‍රණ යෙදීම ලාභදායිද?

තේ වගාවට පොහොර යෙදීමෙන් ප්‍රධාන ලෙස ලබා දෙනුයේ නයිට්‍රජන්, පොස්පරස් සහ පොටැසියම් යන පෝෂකයන් වේ. මෙයින් වඩාත් වැදගත් වනුයේ නයිට්‍රජන් පෝෂකයයි. ප්‍රධාන වශයෙන් නයිට්‍රජන් අඩංගු ප්‍රභව දෙකක් ඇත. එනම් යූරියා (නයිට්‍රජන් - 46%) සහ ඇමෝනියම් සල්ෆේට් (නයිට්‍රජන් - 20.6%) වේ. මේ අනුව U- මිශ්‍රණවල (U- 709, VPLC-880) යූරියා අඩංගු වන අතර T - මිශ්‍රණවල (T-1130, T-750, T-200) ඇමෝනියම් සල්ෆේට් අඩංගු වේ.

මේරූ තේ වගාවට පොහොර යෙදීමේදී එක් එක් අස්වනු පරාසය අනුව, වඩාත්ම නිවැරදිව ප්‍රකාශ කරන්නේ නම් විභව අස්වැන්න අනුව, ලබා දිය යුතු යම් නයිට්‍රජන් ප්‍රමාණයක් ඇත. පොහොර මිශ්‍රණ වල අඩංගු නයිට්‍රජන් ප්‍රමාණයන් වෙනස් වන නිසා විභව අස්වැන්න අනුව, ලබාදිය යුතු නයිට්‍රජන් ප්‍රමාණය ලබාදීම සඳහා එක් එක් පොහොර මිශ්‍රණ වලින් ලබාදිය යුතු පොහොර ප්‍රමාණයද එකිනෙකට වෙනස් වේ.

විභව අස්වැන්න අනුව අවශ්‍ය නයිට්‍රජන් ප්‍රමාණයන් ලබා දීම සඳහා එක් එක් පොහොර මිශ්‍රණයෙන් යෙදිය යුතු ප්‍රමාණයන් පහත පරිදි වේ. (මෙහිදී විභව අස්වනු මට්ටම වඩාත් පැහැදිලි වීම සඳහා මාසෙකට ලබා ගන්නා අමු දලු, අස්වැන්න ලෙස සඳහන් කර ඇත.)

මේ අනුව තේ වගාවක කිසියම් විභව අස්වැන්නක ට අදාල නයිට්‍රජන් ප්‍රමාණය ලබාදීම සඳහා යෙදිය යුතු U- මිශ්‍රණ ප්‍රමාණය මෙන් දෙගුණයකට වැඩි ප්‍රමාණයක් T - මිශ්‍රණයක් භාවිත කරන්නේ නම් අවශ්‍ය වන බව පැහැදිලිය.

| අමු දළු අස්වැන්න (මසකට/ අක්/ කිග්‍රෑ) | VPLC- 880 කි.ග්‍රෑ./වසර/ අක්. | U-709 කි.ග්‍රෑ./වසර/ අක්. | T-1130 කි.ග්‍රෑ./ වසර/අක්. |
|---|---|---|---|
| 300 | 352 | 369 | 685 |
| 400 | 352 + යූරියා 45 | 425 | 935 |
| 500 | 352 + යූරියා 80 | 455 | 1,000 |
| 600 | 352 + යූරියා 110 | 510 | 1,120 |

වෙළඳ පොලේ පොහොර ටොන් එකක සාමාන්‍ය මිළ(රු)

| | | |
|---|---|---|
| යූරියා | - | 51,000/- |
| U-709 | - | 48,800/- |
| VPLC 880 | - | 49,600/- |
| T-1130 | - | 38,000/- |
| ඩොලමයිට් | - | 5,250/- |

මේ අනුව එක් එක් පොහොර මිශ්‍රණ වලින් විවිධ අස්වනු මට්ටම් සඳහා වැයවන මුදල පහත ප්‍රස්ථාරයේ දැක්වේ. මේ අනුව තේ පර්යේෂණායතනයේ නිර්දේශිත මිශ්‍රණ භාවිතා කිරීමෙන් අවම පිරිවැයක් දැරීමට සිදුවන බව පැහැදිලි වේ.

මේ අනුව තේ පර්යේෂණායතනය විසින් නිර්දේශ කර ඇති U මිශ්‍රණයක් වන VPLC-880 සඳහා අඩු මුදලක් වැයවන බව පැහැදිලිය. මීට අමතරව ඇමෝනියම් සල්ෆේට් අඩංගු මිශ්‍රණ යෙදීමෙන් පස සීඝ්‍රයෙන් ආම්ලික වේ. වැයවන මුදලද අධිකය. (2005 වසර තුලදී අප විසින් පරීක්ෂා කරන ලද පස් සාම්පල් වලින් තේ වගාවට සුදුසු පී.එච් පරාසයක පැවතුණේ ඒවායින් 32% ක් පමණකි)




ජානක මහින්දපාල